00046

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම
අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය I – 2016/2017
**LWU3315/LLU5712-** පොදු අන්තර්ජාතික නීතිය
කාලය - පැය එකයි.

---

දිනය - 2017.11.24 වේලාව - පෙ.ව.11.00 - මධ්‍යාහ්න 12.00 දක්වා

---

**මුළු ප්‍රශ්න ගණන 02 යි.**
**එක් (01) ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.**

01. "අන්තර්ජාතික යුක්තිය පිළිබඳ අධිකරණයට ඉදිරිපත් කරනු ලැබූ ආරවුලක් පිළිබඳ තීරණයකට එළඹීමේ දි කුමන මූලාශ්‍රයක් සම්බන්ධයෙන් වුව ද, මූලාශ්‍රවල සම්බන්ධතාව පිළිබඳ කාරණා දෙකක් සම්බන්ධයෙන් සලකා බැලිය යුතු විය හැක. පළමුව යම් රීතියක් අන්තර්ජාතික නීතියෙහි මූලාශ්‍ර වන සම්මුතීන් සහ චාරිත්‍ර යන දෙකටම පොදු වන අවස්ථාවක දී අධිකරණය විසින් කුමන මූලාශ්‍රය අදාල කළයුතු දැයි ප්‍රශ්නයක් පැන නැගිය හැකිය. දෙවෙනි ප්‍රශ්නය වන්නේ 38(1) වගන්තියෙහි දක්වා ඇති සියළු මූලාශ්‍රයන් එක්තරා පිළිවෙළකට පෙළගස්වා ඇති බැවින් ඒවායේ යම් ධුරාවලියක් පවතින්නේ ද යන්න ය."

A.Abass, *International Law,* Oxford University Press.2014, pg56

අන්තර්ජාතික නීතියේ මූලාශ්‍රයන් හි ධුරාවලිය සම්බන්ධ පහත දැක්වෙන තර්ක වලින් **<u>එකක් (01)</u>** , ඉහත ප්‍රකාශය ඇසුරින් සාකච්ඡා කරන්න.

ආ) අන්තර්ජාතික යුක්තිය පිළිබඳ අධිකරණ ව්‍යවස්ථාවෙහි 38(1) වගන්තිය තුළ දක්වා ඇති අන්තර්ජාතික නීතියෙහි මූලාශ්‍රයන් හි ධුරාවලියක් නොමැත. එය මෙම මූලාශ්‍ර අතුරින් සමහරක් පෙළගැස්වීම යුක්ති සහගත බව පෙන්වීම සඳහා ගත් නිෂ්ඵල ක්‍රියාවක් මිස අන් කිසිවක් නොවේ.

ආ) අන්තර්ජාතික නීතියෙහි මූලාශ්‍ර ලෙස චාරිත්‍ර සහ සම්මුතීන් අතර ඇති සම්බන්ධතාව ඉතා පැටළිලි සහිත එකකි. මක් නිසාද යත් එකක් අනෙකට බලපෑම් ඇති කිරීම; එකකින් අනෙක ප්‍රතිබිම්බනය වීම හෝ එකකින් අනෙක යටපත් වීම වන බැවිනි.

(ලකුණු 20)

02. අන්තර්ජාතික නීතිය දේශීය අධිකරණ මඟින් පිළිගැනීම පහත දක්වා ඇති නඩු තීරණ වලින් <u>**දෙකක් (02)**</u> ඇසුරින් සාකච්ඡා කරන්න.

අ. නල්ලරත්නම් සිංහරාසා එ.නීතිපති (S.C.Spl(LA)No.182/99)

ආ. සේපාල ඒකනායක එ. නීතිපති (1988 S.L.R 146)

ඇ. ලීලාවතී එ. ආරක්ෂක සහ අභ්‍යන්තර කටයුතු ඇමති (68 N.L.R. 48)

(ලකුණු 20)

හිමිකම් ඇවිරිණි.

00046

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**FACULTY OF HUMANITIES AND SOCIAL SCIENCES**
**DEPARTMENT OF LEGAL STUDIES**
**LL.B DEGREE PROGRAMME –LEVEL V**
**CONTINUOUS ASSESMENT TEST I -2016/2017**
**LLU5712/LWU3315-PUBLIC INTERNATIONAL LAW**
**DURATION-ONE (1) HOUR**

**Date: 24th November 2017** **Time: 11.00 am -12 noon**

**Total No. of Questions: 02**
**Number of Question to be answered: 01**

1. "Whatever sources the ICJ might want to consider in the determination of a dispute submitted to it, the court has to deal with two issues on the relationship of the sources. First, there might be an issue arising as to which source is to be applied by the court, where there is a rule that is common to both treaty and custom as sources of international law. The second issue is whether there is a hierarchy between all of the sources listed in Article 38(1), since they appear in a particular order"

   A.Abass, *International Law,* Oxford University Press, 2014, pg 56

   In the light of the above statement discuss **one (01)** of the following arguments regarding the hierarchy of sources in International Law.

   a) There is no hierarchy among the sources of international law listed in Article 38 (1) of the ICJ Statute. It is nothing but an exercise in futility to attempt to justify a ranking of some sort among these sources.

   b) The relationship between custom and treaties, as sources of international law, is very intricate one. This is because one influences the other; one is reflective of, or is subsumed by, the other.

(20 Marks)

2. Discuss the reception of International Law in domestic courts with reference to any **two (02)** case laws given below;

   a. *Nallaratnam Singharasa* v. *AG*S.C.SpL (LA) No.182/99
   b. *Sepala Ekanayake* v. *AG* (1988) S.L.R 146
   c. *Leelawathie* v. *Minister of Defence and External Affairs* (68)N.L.R.48

(20 Marks)

-Copyrights reserved-